# බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව
## பௌத்த மத அலுவல்கள் திணைக்களம்
## DEPARTMENT OF BUDDHIST AFFAIRS

"දහම්පාය", අංක 135, ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත, කොළඹ 07.
"தஹம்பாய" இல. 135, ஸ்ரீமத் அனகாரிக்க தர்மபால மாவத்தை, கொழும்பு 07.
"Dahampaya" No. 135, Srimath Anagarika Dharmapala Mawatha, Colombo 07.

ප්‍රාදේශීය කාර්යාලය, දිස්ත්‍රික් ලේකම් ගොඩනැගිල්ල, මහනුවර.
பிராந்திய அலுவலகம், மாவட்ட செயலகக் கட்டிடம், கண்டி.
Regional Office, District Secretariat Building, Kandy.

ප්‍රාදේශීය කාර්යාලය, දිස්ත්‍රික් ලේකම් ගොඩනැගිල්ල, රත්නපුර.
பிராந்திய அலுவலகம், மாவட்ட செயலகக் கட்டிடம், இரத்தினபுரி.
Regional Office, District Secretariat Building, Ratnapura.


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | DBA/MEDIA/NEWS/2023-3 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2023.02.15 |

ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

කොළඹ 05

<u>දහම් පාසල් ගුරු සහතිකපත්‍ර විභාගයට ( 2023 ) අයදුම්පත් කැඳවයි</u>

දහම් දැනුමෙන් පෝෂණය වූ සාරධර්ම සපිරි දරු පරපුරක් බිහිකිරීමෙහිලා නිස්සරණාධ්‍යාසයෙන් කැප වී සිටින දහම් පාසල් ගුරුභවතුන්ගේ දහම් දැනුම වර්ධන කිරීම, සේවය අගය කිරීම හා උසස් අධ්‍යාපනයට නැඹුරු කිරීම මඟින් සමාජ පිළිගැනීමක් ලබාදීම අරමුණු කරගෙන බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන උක්ත විභාගය 2023 ජුනි මස 17 දින දිවයින පුරා මධ්‍යස්ථාන 25 දී පැවැත්වීමට සංවිධානය කර ඇත.

2023.03.15 දිනට අවම වශයෙන් මාස 6 ක් අඛණ්ඩව බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි දහම් පාසලක ගුරුභවතෙකු ලෙස සේවය කර තිබීම, 2022.09.15 දිනට වයස අවුරුදු 18 ට වැඩිවීම මෙම විභාගය සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලෙසින් සැලකේ.

මාර්ගගත ( On line ) ක්‍රමයට සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2023.03.15 දිනට පෙර යොමු කළයුතු අතර ඊට අදාළ අයදුම්පත හා තොරතුරු https://forms.office.com/r/9S8Efs9BLB සබැඳිය මඟින් ලබාගත හැක. 2021/2022 වර්ෂය සඳහා සංවිධානය කර තිබූ දහම් පාසල් ගුරු සහතිකපත්‍ර විභාගය දිවයිනේ උද්ගතව තිබූ කොවිඩ් වසංගතය හා ඒ හා සබැඳි ප්‍රායෝගික ගැටලු හේතුවෙන් පැවැත්වීමට නොහැකි වූ අතර 2021 හා 2022 වර්ෂයේ විභාගය සඳහා අයදුම් කරන ලද අයදුම්කරුවන් ද නැවත 2023 වර්ෂයේ විභාගය සඳහා අයදුම්පත්‍ර යොමු කළ යුතු වේ.

සුනන්ද කාරියප්පෙරුම
බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්

tamilguru.lk